# විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදනවලට වැඩිමනත් වශයෙනි.

ඊශ්‍රායල් බලධාරීන්ට අනුව, **2020.04.07** වන දින වන විට ඊශ්‍රායලයේ තහවුරු කරන ලද කොරෝනා රෝගීන් සංඛ්‍යාව **9,006** දක්වා වැඩි වී ඇති අතර මරණ සංඛ්‍යාව **59** ක් වේ.

ඊශ්‍රායලයේ සීඝ්‍රයෙන් වැඩිවන කොරෝනා රෝගීන් සංඛ්‍යාව සහ මරණ සංඛ්‍යාව මෙන්ම මෙම සතියේ ඉදිරි දිනවල යෙදෙන යුදෙව් ආගමික උත්සව සමයද **(Passover holiday season)** සැලකිල්ලට ගෙන ඊශ්‍රායල් රජය විසින් **2020** අප්‍රේල් **07** වන අඟහරුවාදා ප.ව. **4.00** සිට **2020** අප්‍රේල් **10** වන සිකුරාදා පෙ.ව. **7.00** දක්වා බලපැවැත්වෙන පරිදි ඊශ්‍රායලය සම්පූර්ණයෙන්ම වසා දමන බව ප්‍රකාශයට පත් කර ඇත.

එම නිසා ඉහත කාල සීමාව තුල සිය වාසස්ථානවල රැදී සිටින මෙන් ඔබ සියළු දෙනා වෙත කාරුණිකව දැනුම් දෙමු.

කලින් දැනුම් දුන් පරිදි, ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා ප්‍රජාවේ අතිශය හදිසි අවශ්‍යතාවයන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පහත සඳහන් ජංගම දුරකථන අංකය **2020** මාර්තු **09** වන දින සිට පැය **24** පුරා ක්‍රියාත්මක වේ.

රුවන් වික්‍රමසිංහ මහතා - **054 7215815**
දෙවන ලේකම් (රැකියා හා සුභසාධන)

ඊශ්‍රායල් රාජ්‍ය තුළ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සහ එය මර්ධනය කිරීම සඳහා දැනට බලපත්වන උපදෙස් සම්බන්ධයෙන් වැඩිදුරටත් දැන ගැනීම සඳහා පහත දැක්වෙන ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියට පිවිසෙන මෙන් කාරුණිකව දන්වනු ලැබේ.

https://govextra.gov.il/ministry-of-health/corona/corona-virus-en/

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

**07.04.2020**